සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

## දෙවන වාර පරීක්ෂණය - 2025
## Second Term Test - 2025

32 S I

**6 ශ්‍රේණිය** | **ගණිතය** | **කාලය පැය 02 යි**

නම/ විභාග අංකය:

## I කොටස

- ප්‍රශ්න සියල්ලට ම මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න.
- I කොටස සඳහා එක් ප්‍රශ්නයකට ලකුණු 02 බැගින් ලැබේ.

01. ණය දෙන සමිතියක රුපියල් 100502800 ක මුදලක් තිබුණි.
   (i) මෙම මුදල සම්මත ආකාරයට ලියන්න.
   (ii) එහි සංඛ්‍යා නාමය ලියන්න.

02. 54 වන්නේ 3 හි කීවන ගුණාකාරය ද?

03. 3 > ............... හිස්තැනට ගැළපෙන සංඛ්‍යා තෝරා යටින් ඉරක් අඳින්න.
   (i) 5 (ii) 0 (iii) 6 (iv) -2

04. $\frac{5}{10}$ , $\frac{5}{6}$ , $\frac{5}{8}$ මෙම භාග ආරෝහණ පිළිවෙලට සකස්කර ලියන්න.

05. විද්‍යුත් ඔරලෝසු මුහුණතක 15 : 25 ලෙස වේලාව සටහන්ව තිබුණි. මෙම වේලාව පැය 12 ක්‍රමයට අනුව දක්වන්න.

06. $\frac{8}{100}$ දශම සංඛ්‍යාවක් ලෙස නිවැරදිව ලියා ඇති පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.
   (i) 0.8 (ii) 0.08 (iii) 8.0 (iv) 0.80

07. -2 සහ 3 අතර ඇති කුඩාම නිඛිලය සංඛ්‍යා රේඛාව මත ලකුණුකර දක්වන්න.




08. කමනී වාර පරීක්ෂණයක දී ගණිතය විෂයය සඳහා ගත් ලකුණ ආසන්න දහයේ ගුණාකාරයට වැටයූ විට 60 වේ. ඇය එම වාර පරීක්ෂණයේදී ලබාගත් ලකුණ සඳහා තිබිය හැකි උපරිම හා අවම ලකුණ පිළිවෙලින් ලියා දක්වන්න.

09. සුළු කරන්න. 204 x 15

10. 12.07 දශම සංඛ්‍යාව කියවන ආකාරය වචනයෙන් ලියා දක්වන්න.

11. සමන්ගේ නිවස පිහිටා ඇත්තේ පාසලේ සිට කුමන දිශාවකින් ද?




12. < , > , = මෙම ලකුණු වලින් නිවැරදි ලකුණ යොදා හිස්තැන් සම්පූර්ණ කරන්න.

(i) $\frac{3}{6}$ .......... $\frac{1}{2}$ (ii) $\frac{2}{7}$ .......... $\frac{3}{8}$

13. රුසිරුගේ නිවසේ සිට පාසලට ඇති දුර 2 km 40 m කි. එම දුර මීටර් වලින් ලියා දක්වන්න.

14. පහත වාක්‍යයේ හිස්තැන් සම්පූර්ණ කරන්න.

තලයක ...................... බව සොයාගැනීම සඳහා ලම්බය ද තලයක ...................... බව සොයාගැනීමට ස්ප්‍රීතු ලෙවලය ද භාවිත කරයි.

15. හිස් කොටුවලට ගැලපෙන නිවැරදි සංඛ්‍යා ලියන්න.




16. රූපයේ පෙන්වා ඇති $a$ හා $b$ කෝණ විශාලත්වය අනුව නම් කර දක්වන්න.




(i) $a$ ...................... කෝණයකි. (ii) $b$ ...................... කෝණයකි.

17. සුළු කරන්න.

| | දින | පැය |
|---|---|---|
| | 2 | 10 |
| + | 1 | 17 |
| | | |

18. 3467 සංඛ්‍යාවේ 4 න් නිරූපිත අගය ලියන්න.

19. පහත ප්‍රකාශ හරිනම් '✓' ලකුණ ද, වැරදි නම් 'X' ලකුණ ද හිස් කොටු තුළ යොදන්න.

(i) 2 යනු ඉරට්ටේ ප්‍රථමක සංඛ්‍යාවකි. ☐

(ii) සියළුම සමචතුරස්‍ර සංඛ්‍යා සංයුක්ත සංඛ්‍යා වේ. ☐

20. ක්‍රීඩා උත්සවයක ක්‍රීඩා තරග ප.ව. 2.45 ට ආරම්භ වී ප.ව. 3.25 ට අවසන් විය. ක්‍රීඩා තරග සඳහා ගත වූ කාලය ගණනය කරන්න.

- පළමු ප්‍රශ්නයට සහ තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.
- පළමු ප්‍රශ්නයට පිළිතුරු සඳහා ලකුණු 16 ක් ද, අනෙකුත් ප්‍රශ්න සඳහා නිවැරදි පිළිතුරට ලකුණු 11 බැගින් ද ලැබේ.

01. (a)




A, B, C ලෙස නම් කර ඇති කඩදාසි පටි 3 ක් සමාන කොටස් වලට බෙදා ඉන් කොටස් කීපයක් පාටකර ඇති ආකාරය ඉහත දැක්වේ.

(i) A, B හා C අක්ෂර මගින් දක්වා ඇති කඩදාසි පටිවල පාටකර ඇති කොටස භාග ලෙස පිළිවෙලින් ලියන්න. (ල.03)

(ii) ඉහත (i) කොටසේ ලියන ලද භාග වලින් ඒකක භාග තෝරා ලියන්න. (ල.02)

(iii) B අක්ෂරයෙන් සටහන් කඩදාසි පටියේ පාටකර ඇති කොටසින් දැක්වෙන භාගයට හරය 10 ට අඩු තුල්‍ය භාග 02 ක් ලියන්න. (ල.02)

(b)

| | |
|---|---|
| $\frac{1}{3}$ , | $\frac{2}{9}$ |
| $\frac{7}{10}$ , | $\frac{11}{20}$ |

(i) මෙහි සටහන් කර ඇති භාග අතරින් හරය 10 ට අඩු භාග 2 ක් තෝරාගෙන එම භාග දෙක එකතු කරන්න. (ල.03)

(ii) $\frac{7}{10}$ , $\frac{11}{20}$ භාග වලින් විශාලම භාගය තෝරා ලියන්න. (ල.01)

(iii) ඉහත (ii) කොටසේ විශාලම භාගයෙන් කුඩාම භාගය අඩු කරන්න. (ල.03)

(c) මල් වට්ටියක මල් 15 ක් ඇත. ඉන් 6 ක් රතු පාට ද, 2 ක් කහ පාට ද ඉතිරි ඒවා සුදු පාට ද වේ.

(i) වට්ටියේ ඇති සුදු පාට මල් ගණන කීයද? (ල.01)

(ii) සුදු පාට මල් ගණන වට්ටියේ ඇති මුළු මල් ගණනේ භාගයක් ලෙස දක්වන්න. (ල.01)

02. (i) මෙම සමූහයේ ඇති දෑ අතරින් සංඛ්‍යා හැර ඉතිරි ඒවා පොදු ලක්ෂණය අනුව කාණ්ඩ දෙකකට වෙන්කර නම් කරන්න. (ල.04)




ඉහත සමූහයේ ඇති සංඛ්‍යා පමණක් භාවිත කර පහත ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

(ii) 6 හි ගුණාකාර වන සංඛ්‍යා 4 ක් ලියන්න. (ල.02)

(iii) 24 නොවන 24 හි සාධක 2 ක් තෝරා ලියන්න. (ල.02)

(iv) 5 න් ඉතිරි නැතිව බෙදෙන සංඛ්‍යා දෙකක් ලියන්න. (ල.02)

(v) 736□ සංඛ්‍යාව 2 න් හා 5 න් ඉතිරි නැතිව බෙදේ. හිස් කොටුවට යෙදිය හැකි ඉලක්කම සොයන්න. (ල.01)

03. (a)




| 6.07 |
|---|

(i) ගණක රාමුවෙහි දැක්වෙන සංඛ්‍යාව ඉලක්කමෙන් ලියන්න. (ල.02)

(ii) 6.07 සංඛ්‍යාව ගණක රාමුවක දක්වන්න. (ල.02)

(iii) ඉහත ගණක රාමුවෙන් නිරූපණයවන සහ සංඛ්‍යාත්මකව දක්වා ඇති දශම සංඛ්‍යා දෙකෙන් විශාලම දශම සංඛ්‍යාව තෝරා ලියන්න. (ල.01)

(b) සුළු කරන්න.

(i) $35.26 + 7.4$ (ල.02)

(ii) $70.8 - 6.27$ (ල.02)

(c) මෙය පිටපත්කරගෙන හිස් කොටුවලට ගැළපෙන ඉලක්කම් ලියන්න.

$$3.4\square = 3 + \frac{\square}{10} + \frac{7}{100}$$ (ල.02)

---

04.




A, B, C, D, E, F, G යනු සංවෘත හා සංවෘත නොවන තල රූප කිහිපයකි. ඒ ඇසුරෙන් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(i) සංවෘත සරල රේඛීය තල රූප නොවන රූප දෙකක අක්ෂර ලියන්න. (ල.02)

(ii) සෘජුකෝණ පමණක් අඩංගු සංවෘත තල රූප දෙකක අක්ෂර ලියන්න. (ල.02)

(iii) D හා G අක්ෂර මගින් දැක්වෙන තල රූප නම් පිළිවෙලින් ලියන්න. (ල.02)

(iv)  මෙම රූපය සඳහා යොදාගෙන ඇති තල රූප වල අක්ෂර ලියන්න. (ල.02)

(v) B අක්ෂරයෙන් දැක්වෙන තලරූපයේ නම ලියා එහි පරිමිතිය 32 cm නම් එම තල රූපයේ පැත්තක දිග සොයන්න. (ල.03)

---

05.

(a)




(b)




(c)




ඉහත (a), (b), (c) ලෙස නම්කර ඇත්තේ ඝන වස්තු 3 ක් සෑදිය හැකි පතරොම් තුනකි.

(i) පහත වගුව පිළිතුරු පත්‍රයේ පිටපත් කරගෙන ඉහත පතරොම් තුන භාවිතයෙන් එහි හිස්තැන් සම්පූර්ණ කරන්න.

| පතරොම | සෑදිය හැකි ඝනවස්තුවේ නම | දාර ගණන | ශීර්ෂ ගණන | මුහුණත් ගණන | මුහුණතක හැඩය |
|---|---|---|---|---|---|
| (a) | ........................ | 12 | 8 | ............... | ............... |
| (b) | ........................ | ............... | ............... | 6 | ඍජුකෝණාස්‍රය |
| (c) | ........................ | ............... | 4 | 4 | ............... |

(ල.09)

(ii) (c) අක්ෂරයෙන් නම්කර ඇති පතරොම භාවිතයෙන් සෑදිය හැකි ඝන වස්තුවේ පැත්තක දිග සොයන්න. (ල.01)

(iii) (b) අක්ෂරයෙන් නම් කර ඇති පතරොමෙහි අඳුරු කර ඇති ඍජුකෝණාස්‍රයේ පළල කීයද? (ල.01)

06.




පවිත්‍රා ඉහත දක්වා ඇති පළතුරු යුෂ, ජලය, සීනි ද්‍රාවණය එක්කර පළතුරු බීම සාදා වීදුරුවකට 200 *ml* බැගින් වත්කර එම බීම වීදුරුවක් රු. 100 බැගින් විකුණයි.

(i) පළතුරු යුෂ ද්‍රාවණ ප්‍රමාණය මිලි ලීටර් වලින් ලියන්න. (ල.1)

(ii) පළතුරු යුෂ, සීනි ද්‍රාවණයට වඩා කොපමණ ප්‍රමාණයකින් වැඩිදැයි සොයන්න. (ල.2)

(iii) භාජන තුනෙහි ඇති ද්‍රාවණ ප්‍රමාණ එක්කර සාදාගන්නා ලද මුළු පළතුරු බීම ප්‍රමාණය සොයන්න. (ල.2)

(iv) ඉහත සාදාගන්නා ලද මුළු පළතුරු බීම ප්‍රමාණය බීම වීදුරු කීයකට ප්‍රමාණවත් වේ දැයි සොයන්න. (ල.2)

(v) මෙදින ඇය පළතුරු බීම අලෙවියෙන් රුපියල් 3500 ක ආදායමක් ලබයි. මෙම ආදායම ලබාගැනීමට ඉහත සැකසූ බීම ප්‍රමාණයට අමතරව නැවත සැකසූ පළතුරු බීම ප්‍රමාණය කොපමණ ද? (ල.4)

---

07. (a) (i) 12 හි සාධක අතරින් ප්‍රථමක සංඛ්‍යා දෙකක් ලියන්න. (ල.2)

(ii) 50 ත් 100 ත් අතර පිහිටි සමචතුරස්‍ර සංඛ්‍යා දෙකක් ලියා දක්වන්න. (ල.2)

(iii) $1+2+3+4+5+6+7=\square$

හිස් කොටුවට ගැළපෙන සංඛ්‍යාව සොයා එය කීවන ත්‍රිකෝණ සංඛ්‍යාවදැයි ලියා දක්වන්න. (ල.2)

(iv) $\square + \square = 25$ හිස් කොටුවලට ලැබිය හැකි ත්‍රිකෝණ සංඛ්‍යා දෙක සොයා පිළිතුරු පත්‍රයෙහි ලියන්න. (ල.2)

(b)




මෙම ත්‍රිකෝණයේ පරිමිතිය සොයා එය මීටර හා සෙන්ටිමීටර වලින් දක්වන්න. (ල.3)